චතුරාර්ය සත්‍යාවබෝධයට ධර්ම දේශනා...

3

මහාලි සූත්‍රය

සංයුත්ත නිකාය 3 (උපය වර්ගය)

(මහාලි ලිච්ඡවි හට වදාළ දෙසුම)

පූජ්‍ය කිරිබත්ගොඩ ඤාණානන්ද හිමි

e-mail : mahamevnawa@mahamevna.org | Web : www.mahamevna.org

චතුරාර්ය සත්‍යාවබෝධයට ධර්ම දේශනා 03

මහාලි සූත්‍රය

අන්තර්ජාල සංස්කරණය

ශ්‍රී බු.ව. 2551 දුරුතු මස / 2008 ජනවාරි

© මහමෙව්නාව භාවනා අසපුව, ශ්‍රී ලංකාව.
www.mahamevna.org | www.gautamabuddha.org

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මාසම්බුද්ධස්ස.
ඒ භාග්‍යවත් අරහත් සම්මා සම්බුදුරජාණන් වහන්සේට නමස්කාර වේවා!

මහාලි සූත්‍රය

(සංයුත්ත නිකාය 3 - උපය වර්ගය)

ශ්‍රද්ධාවන්ත පින්වතුනි,

මේ වෙලාවේ ඔබ ඉගෙන ගන්නේ **සංයුත්ත නිකායේ තුන්වන කොටසට** අයිති දේශනාවක්. මේ දේශනාවේ නම **මහාලි සූත්‍රය.** මහාලි කියලා කියන්නේ ලිච්ඡවි කුමාරයෙක්. මහාලි ලිච්ඡවි කුමාරයාට දේශනා කරපු දේශනාව.

ඒ දිනවල භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ වැඩසිටියේ **විශාලා මහනුවර** මහා වනයේ කූටාගාර ශාලාවේ. මේ මහාලි කියන ලිච්ඡවි කුමාරයා බුදුරජාණන් වහන්සේව බැහැදකින්න විශාලා මහනුවර කූටාගාර ශාලාවට ගියා. විශාලා මහනුවර කියන්නේ ලිච්ඡවීන් ගේ රාජධානිය. බුදුරජාණන් වහන්සේව බැහැදකලා වන්දනා කරලා එකත්පස්ව වාඩිවෙලා මෙන්න මෙහෙම කාරණාවක් බුදුරජාණන්

©Mahamevnawa Monastery, Sri Lanka.
www.mahamevna.org | www.gautamabuddha.org

වහන්සේට කියා සිටියා. "ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, පූර්ණ කස්සප කියන පුද්ගලයා මෙන්න මෙහෙම කියනවා. (පූර්ණ කස්සප කියන්නේ ඒ කාලේ හිටපු ආගමික මතයක් කියාගෙන ගිය කෙනෙක්. ශාස්තෘවරයෙක් හැටියට පෙනී හිටපු කෙනෙක්.) මේ සත්වයන් කිලිටි වෙන්න හේතුවක් නෑ. මේ සත්වයන් කිලිටි වෙන්නේ හේතුවක් නොමැතිවයි. උපකාරක ධර්මයක් නොමැතිවයි. ඒ වගේ ම මේ සත්වයෝ හේතු ප්‍රත්‍යයකින් තොරව පිරිසිදු වෙනවා." මේ එයා කියා ගෙන ගිය දේ. පූර්ණ කස්සප මේක කියා ගෙන යන කොට ඒ කාලෙත් ඕවට අහුවෙන මිනිස්සුත් හිටියා.

ඉතින් බුදුරජාණන් වහන්සේ මේ අදහසට එකඟ වුනේ නෑ. බුදුරජාණන් වහන්සේ මහාලිට වදාළා. "**(අත්ථි මහාලි, හේතු අත්ථි පච්චයෝ සත්තානං සංකිලේසාය, සහේතු සප්පච්චයා සත්තා සංකිලිස්සන්ති, අත්ථි මහාලි, හේතු අත්ථි පච්චයෝ සත්තානං විසුද්ධියා, සහේතු සප්පච්චයා සත්තා විසුජ්ඣන්තී'ති)** පින්වත් මහාලි, සත්වයන් හේතු ප්‍රත්‍ය සහිතව ම යි කිලුටු වෙන්නෙ. ඒ වගේ ම සත්වයන් හේතු ප්‍රත්‍ය සහිතව ම යි පිරිසිදු වෙන්නෙ" කියලා. එහෙම කියලා උන්වහන්සේ නිශ්ශබ්ද වුනා. ඊට පස්සේ මහාලි බුදුරජාණන් වහන්සේගෙන් ප්‍රශ්නයක් ඇහුවා. "ස්වාමීනි, එහෙම නම් අපිට කියා දෙන්න බලන්න මේ සත්වයන් හේතු ප්‍රත්‍ය සහිතව නම් කිලිටි වෙන්නේ, ඒ කිලිටි වෙන හේතුව කුමක් ද? මොකෙන් ද කිලිටි වෙන්නේ?" කියලා ඇහැව්වා.

එතකොට බුදුරජාණන් වහන්සේ පංච උපාදානස්කන්ධය මුල් කරගෙන මේ දේශනාව වදාළේ. ගිහි කෙනෙකුට යි මේ ගැඹුරු දේශනාව කළේ. එතකොට අපිට තේරුම් ගන්න පුළුවනි ඒ කාලේ හිටපු ගිහි ජනතාව සමඟ හොඳ ගැඹුරු ධර්ම සාකච්ඡාවන් කරලා තියෙනවා. හොඳට ඒගොල්ලොත් එක්ක මේ පංච උපාදානස්කන්ධය ගැන කථාබස් කරන්න පුළුවන්.

ඉතින් බුදුරජාණන් වහන්සේ මහාලිට වදාළා, "**(රූපඤ්ච හිදං මහාලි, ඒකන්තදුක්ඛං අභවිස්ස)** පින්වත් මහාලි, මේ රූපය ඒකාන්ත දුකක් වුණා නම්, **(දුක්ඛානුපතිතා)** දුකේ ම වැටුණා නම්, **(දුක්ඛාවක්කන්තා)** දුකේ ම බැසගත්තා නම්, **(අනවක්කන්තං සුඛේන)** මේ රූපය තුළ සැපයක් ඇති වුනේ නැත්නම් **(නයිදං සත්තා වේදනාය**

©Mahamevnawa Monastery, Sri Lanka.
www.mahamevna.org | www.gautamabuddha.org

සාරජ්ජෙය්‍යුං) මේ සත්වයෝ මේ රූපයට ඇලෙන්නේ නැහැ. නමුත් **(යස්මා ච ඛෝ මහාලි, රූපං සුඛං)** නමුත් පින්වත් මහාලි, මේ රූපයේ සැපයක් තියෙන නිසා, **(සුඛානුපතිතං)** සැපයේ බැසගත්තු නිසා, **(සුඛාවක්කන්තං)** සැපයට වැටුණු නිසා, **(අනවක්කන්තං දුක්ඛේන)** ඒකාන්ත දුකේ බැසගත්තේ නැති නිසා, **(තස්මා සත්තා රූපස්මිං සාරජ්ජන්ති)** මේ සත්වයෝ මේ රූපයට ඇලෙනවා, ආශා කරනවා. **(සරාගා සංයුජ්ජන්ති)** ඒ ඇලුනාම, රූපයට රාග සහිත වුණාම එයා ඒ රූපයත් එක්ක එකතු වෙනවා. **(සංයෝගා සංකිලිස්සන්ති)** ඒ එකතු වීමෙන් තමයි කිලිටි වෙන්නේ. **(අයම්පි ඛෝ මහාලි, හේතු අයං පච්චයෝ සත්තානං සංකිලේසාය, ඒවං සහේතු සප්පච්චයෝ සත්තා සංකිලිස්සන්ති)** මේක තමයි සත්වයන් ගේ කිලිටි වීමට හේතු වෙච්ච කාරණය."

සාමාන්‍යයෙන් අපි රූප කියලා කියන්නෙ ඇසට දකින දේට, කණෙන් අසන දේට ශබ්ද කියනවා. නාසයෙන් දැනගන්න දේට ගඳ සුවඳ කියල කියනවා. දිවට දැනෙන දේට රසය කියල කියනවා. කයට දැනෙන දේට පහස කියල කියනවා. නමුත් දැන් මෙතනදී රූප කිව්වේ, ඇහෙන් දකින දේ විතරක් නෙමෙයි. **(චත්තාරෝ ච මහාභූතා චතුන්නඤ්ච මහාභූතානං උපාදාය රූපං)** සතර මහා ධාතුත්, සතර මහා ධාතු නිසා හටගත් දේවල් වලටත්. බුදුරජාණන් වහන්සේ පෙන්වා දීලා තියෙනවා;

- **පඨවි ධාතු 20 ක් තියෙනවා**
- **ආපෝ ධාතු 12 ක් තියෙනවා**
- **තේජෝ ධාතු 4 ක් තියෙනවා**
- **වායෝ ධාතු 6 ක් තියෙනවා**

මේ ඔක්කෝම රූප. රූප කියන තනි වචනයෙන් තමයි හඳුන්වන්නේ. ඇයි මේකට බුදුරජාණන් වහන්සේ රූපය කියලා පාවිච්චි කළේ? **(රුප්පතීති ඛෝ භික්ඛවේ, තස්මා රූපන්ති වුච්චති)** නැසී වැනසී යන නිසා රූපය කියලා කියනවා. දැන් මේ සතර මහා ධාතුන්ගෙන් හැදිච්ච අපේ මේ ශරීර නැසී වැනසී යන්න පටන් ගත්ත ශරීර නෙමෙයි ද? දැන් අපේ ශරීර නැසී වැනසී යන්න පටන් ගෙන තියෙනවා.

©Mahamevnawa Monastery, Sri Lanka.
www.mahamevna.org | www.gautamabuddha.org

නමුත් මේ කය තුළ, රූප තුළ, සැපයක් තියෙනවා. ඒක මොකක් ද? ඒක තමයි රූපයේ තිබෙන ආශ්වාදය. මේ රූපයේ ආශ්වාදයක් තිබුනේ නැත්නම්, කාටවත් ඕන වෙන්නෙ නෑ මේ වගේ කයක්. නමුත් අපි හොඳට ම දන්නවා මේ කය අහිමි වෙනකොට ආයෙමත් කයක් ලබන්න එයා කැමතියි. මේ රූපය නැති වෙනකොට වෙන රූපයක් ලබන්න කැමතියි. මොකද ඒ? ආශ්වාදයක් තිබෙන නිසා මේකට ඇලෙනවා. මේ රූපයට ඇලුන ගමන් එයා ගේ සිත කිලිටි වෙනවා. ඇල්ම නිසා කිලිටි වුණාට පස්සේ එයා දිගින් දිගට ම කිලිටි වෙලා යනවා.

ඉතිං අපි දන්නවා රූපය අවබෝධ නො වීම නිසා, රූපයට ඇලීම නිසා සත්වයා කිලිටි වුණාම සමහර විට නවතින්නේ නිරයේ ගිහිල්ලා. සමහර විට නවතින්නේ තිරිසන් යෝනියේ ගිහිල්ලා. සමහර විට ප්‍රේත ලෝකයේ ගිහිල්ලා. රූපයට ඇලිලා, රූපය කෙරෙහි රාග සහිත වෙලා, රූපයත් එක්ක එකතු වෙලා එයා කයින් අකුසල් කරනවා; වචනයෙන් අකුසල් කරනවා; සිතින් අකුසල් කරනවා.

දැන් ඔබ දන්නවා කයින් වචනයෙන් සිතින් අකුසල් කරන අය ඊටපස්සේ ඒ අකුසලය මුල් කරගෙන අපායේ ගිහිල්ලා උපදිනවා. ඔබට මතක ඇති **ඉසිදාසි** ගැන. ඇය ඊට ආත්ම භාව හතකට කලින් පුරුෂයෙක්. එයා පුරුෂයෙක් වෙලා පරස්ත්‍රීන් සේවනය කරන්නට පටන් ගත්තා. එයා මේ රූපයට ඇලුණා, එකතු වුනා, කිළිටි වුණා. ඊටපස්සේ එතනින් ගිහිල්ලා කෙලින් ම ඉපදිලා තියෙන්නේ නිරයේ. ඊටපස්සේ තිරිසන් ලෝකයට ආවා. වඳුරෙක් වෙලා ඉපදුනා. බූරුවෙක් වෙලා ඉපදුනා. හරකෙක් වෙලා ඉපදුනා.

එතකොට ඒවා විඳවලා දාසියක ගේ කුසේ ඉපදුනා. ඊටපස්සේ ඇය ගේ දෙමව්පියන්ට ගත්තු ණය ගෙවාගන්න බැරිව ඇයව ඒ මුදලාලි අරගෙන ගියා. ඒ මුදලාලි ගේ පුතා ගේ බිරිඳ වුණා. පුතාට හිටියා වෙන බිරිඳක්. ඒ බිරිඳට ඊර්ෂ්‍යාකම් කර කර වෙනස්කම් කරන්න පටන් ගත්තා. ඒකේ විපාකයට මේ ජීවිතේ දී විවාහ හරියන්නේ නැහැ. එයා ගේ ජීවිතයේ දී විවාහ තුනක් කරගත්තනේ. පළවෙනි විවාහය කඩාකප්පල් වුණා. එයා ගේ වරදක් නෑ. එයා හොඳට දෙවියන්ට වගේ අර ස්වාමියාට සළකනවා. ඒ වුණාට අර මනුෂ්‍යයා මෙයාව එළවගත්තා. දෙවැනි විවාහයත් අසාර්ථක වුණා.

©Mahamevnawa Monastery, Sri Lanka.
www.mahamevna.org | www.gautamabuddha.org

අන්තිමට පාරේ යන හිඟන කොල්ලෙකුට කතා කරලා දුන්නා. ටික කාලයක් ගියා ම ඒ හිඟන කොල්ලා කිව්වා "මෙයත් එක්ක ඉන්නවාට වඩා සැපයි හිඟාකෑම" කියල.

එතකොට බලන්න අපිට හොයන්න බැහැ කර්ම විපාක කැරකැවිලා එන ආකාරය. ඊට පස්සේ මෙයාට භික්ෂුණියක් මුණ ගැහුනා. අරහත්වයට පත්වුණාට පස්සේ තමයි මෙයාට තේරුණේ ආපු ගමනේ හැටි. එතකොට බලන්න මේ රූපයට රාග සහිත වීමෙන් සත්වයා කිළිටි වෙලා යනවා. දන්නේ නැතුව රූපයට ඇලෙනවානේ. අන්න ඒකයි බුදුරජාණන් වහන්සේ අපිට පෙන්වා දෙන්නේ මේ රූපයේ ඇත්ත බලන්න කියලා. සමහර විට මේ කය කෙරෙහි කළකිරෙනවා. නමුත් පහදිනවා වෙන කයකට.

අපි දන්නවා බුදුරජාණන් වහන්සේ ගේ කාලයේ ලස්සන කෙනෙක් හිටියා. ඒ තමයි සුභා තෙරණිය. එතුමිය රහත් භික්ෂුණීන් වහන්සේ නමක්. දවසක් මේ රහත් භික්ෂුණීන් වහන්සේ අන්ධ වනයට වැඩියා. ඔන්න සල්ලාලයෙක් පාර හරහට හිටගත්තා. හිටගෙන මොකද කළේ? තර්ජනය කළේ නැහැ. වර්ණනා කළා. කෙලෙස් ඇති කෙනෙකුට ඒ වර්ණනාව කළා නම් එහෙම්ම ම ගෙදර ගිහිල්ලා පදිංචි වෙනවා. ඇයි ඒ? දන්නවා මේ කාන්තාව වර්ණනාවට වසඟ කරගන්න පුළුවන් කියලා.

ගිහිල්ලා කිව්වා. "අනේ... මේ ඔයා ගෙ ඇස් දෙක. ඔය මඳලස බැල්ම කිඳුරියක ගේ වගේ. (ඉතින් මේ මනුස්සයා කිඳුරියන් දැකලා නැහැනේ.) මේ මඳලස බැල්මෙන් තමයි මං වසඟ වුණේ. බලන්න මේ මිහිරි සුළඟ හමා ගෙන එන හැටි, මේ මල් පිපුණු වනයේ. එන්න ගෙදර යන්න. සුදු හඳුන් වලින් ගෙයක් හදලා දෙන්නම්. ඇඳ, පුටු, මේස සුදු හඳුන් වලින් හදලා දෙන්නම්. කසී සළු දෙන්නම්" කිව්වා. දැන් බලන්න මේ සුභා තෙරණිය මොකක් ද කිව්වේ.

"මට තේරෙන්නේ නැහැ, මොකක් ද ඔය කියන්නේ කියලා" බලන්න රාගය ප්‍රහාණය කරපු සිත කොච්චර පිරිසිදු ද? කොච්චර පාරිශුද්ධ සන්තානයක්ද? කිළිටි වෙන්නේ නැහැ ඒ හිත. වෙන කෙනෙක් ගේ නම් ඒ ශබ්දය අහලා කිළිටි වෙනවා නේ, මොහොතකට හරි. ඉතින් සුභා තෙරණිය අර සල්ලාලයාට කිව්වා,

"මම බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවිකාවක්, මම බුදුරජාණන් වහන්සේගේ ළයෙහි උපන් දියණියක් කිව්වා. මම බ්‍රහ්මචාරී කෙනෙක්. මට තේරෙන්නේ නෑ ඔය කතාව" කියල කිව්වා.

එතකොට අර සල්ලාලයා "ඔයා ඔය ජීවත් වන ජීවත් වීම පරිභෝග නො කරන පැන් පොකුණක් වගේ. ඔය චීවරය අත හැරලා එන්න යන්න ගෙදර" කිව්වා. එතකොට සුභා තෙරණිය "මට තේරෙන්නේ නැහැ ඔයා ඔය කියන ඒවා".

සුභා තෙරණිය ගේ සිත සම්පූර්ණයෙන් ම පිරිසිදු වෙලා; රූපය අවබෝධ වෙලා තියෙන්නේ. සුභා තෙරණිය කියනවා. "මේ නව දොරකින් අසූචි වැගිරෙන මේ කයට මොකද ඔච්චර ආශා කරන්නේ?" එච්චරට මේ කයේ යථාර්ථය අවබෝධ කරලා. අන්තිමට සුභා තෙරණියට තේරුණා මේ මනුස්සයාට කොච්චර බණ කීවත් තේරෙන්නේ නැහැ කියලා. සුභා තෙරණියට ලොකු දෙයක් නෙමේ මේක. ඇහැමනේ වර්ණනා කරන්නේ. ඇහැ ගලවලා අර සල්ලාලයාට දුන්නා. ඇහැ ගලෝපුවා ම කොහොම තියෙන්න ඇත් ද?

දැන් මේ අපිට පිටට හැඩට පෙනෙන්නේ ඇස් පිය වලින් ගානට වැහිලා තියෙන නිසානේ. ඇස් පිය යවලා මේක එළියට එන්න ඕන බලන්න. එතකොට පෙනෙන්නේ සුදු පාට බෝලයක මැද්දේ කළු තිතක් තියෙනවා. ඉතින් ඇහැ උදුරලා දුන්නා. "ආ... මෙන්න ඔයා ඔච්චර කියනවා නම් අරගෙන යන්න" කියලා. එතකොට තමයි අර සල්ලාලයාට ඇස් ඇරුනේ. එයා වැඳලා කිව්වා. "බ්‍රහ්මචාරී පින්වතිය, ආයේ නම් මා ඒ වගේ දෙයක් හිතන්නේ නැහැ" කිව්වා. එතකොට බලන්න රූපයට වසඟ වෙලා, කිලුටු වෙලා සිද්ධ වෙච්ච දේ.

දවසක් උත්පලවණ්නා භික්ෂුණීන් වහන්සේ පිණ්ඩපාතේ වැඩියා. දැන් මේ සිද්ධියෙන් අපිට තේරෙනවා පිණ්ඩපාතෙ ටිකක් ලබාගන්න සෑහෙන දුරක් ගිහින් තියෙනවා. ඉතින් දවසට එක වේලනේ දානෙ වළඳන්නේ. සෑහෙන දුරක් පිණ්ඩපාතේ ගිහිල්ලා මහන්සි නිසා දානෙ පාත්තරේ පැත්තකින් තියලා ටිකක් සැතපුණා, කළන්තේ නිසා. අර අසත්පුරුෂයා දින ගැන ගැන හිටියා 'මං අල්ලගන්නම්' කියලා. අර නිදහස් නිකෙලෙස් සිතින් ඉන්න උතුම්

©Mahamevnawa Monastery, Sri Lanka.
www.mahamevna.org | www.gautamabuddha.org

භික්ෂුණිය ගේ ඇඳ යට ඉඳලා ඇඟට පනින කොට උත්පලවණ්ණා භික්ෂුණීන් වහන්සේ ක්ලාන්තේ හැදිලා සැතපිලා හිටියේ. හිතන්න වෙලාවක් නෑ. මොකද මේ උත්පලවණ්ණා තෙරණිය කිව්වේ. " අඥාන පුරුෂය, වැනසෙන්නට එපා!"

කියද්දි කියද්දිත් ඇහුවේ නෑ. මහා ජයක් ගත්තා වගේ එළියට ආවා. කොහෙද ගියේ? කෙලින් ම ගියේ නිරයට. එතකොට අපිට පේනවා කෙලෙසුන්ට වසඟ වෙලා යමෙක් යම් දෙයක් කරද්දී එයාට හිතෙන්නේ මේ මහා ලොකු දෙයක් කරන්නේ කියලා. නමුත් ඒක විපාක දෙන්නට පටන් ගත්තට පස්සේ ඒක අවසන් වන තුරු මිදෙන්න බැහැ. එතකොට මේකෙන් අපට පේනවා මේ රූපය කෙරෙහි ඇල්ම තියෙන නිසානේ මේ ඔක්කොම.

එතකොට මේ දේශනාවේ සඳහන් වෙනවා **(සාරාගා සංයුජ්ජන්ති)** රාග සහිත වීමෙන් එකතු වෙනවා. **(සංයෝගා සංකිලිස්සන්ති)** එකතු වීමෙන් කිළිටි වෙනවා. ඔය විදිහට හේතු සහිතවයි, ප්‍රත්‍ය සහිතවයි සත්වයා කිළිටි වන්නේ.

එතකොට රූපය ගැන තව ටිකක් අපි කියමු. මේ රූපය ගැන තියෙන ආශ්වාදය, මේ රූපයේ තිබෙන ස්වාභාවික දෙයක් හැටියට අවබෝධ කරන්නේ නැතිනම්, එයා රූපයේ ආදීනව එනකොට මොකද කරන්නේ? ආදීනවය එපා කිය කියා අර ආශ්වාදය ම යි සිහි කර කර ඉන්නේ. මොකද එයාට ආදීනවය වෙනම බලන්න තරම් ශක්තියක් ඉවසීමක් නැහැ. ධර්මය අවබෝධ කරන කෙනා ආශ්වාදය, ආශ්වාදය හැටියට දකිනවා. ආශ්වාදය කිව්වේ රූපය නිසා ඇතිවන සැපය යි සොම්නස යි. ආදීනවය කිව්වේ, ඒ රූපය අනිත්‍යයි, දුකයි, අනාත්මයි, වෙනස් වන ධර්මතාවයෙන් යුක්තයි. එතකොට ඒ අදීනවය අවබෝධ කරන්න ඕන රූපය ගැන. එතකොට තමයි රූපය තේරුම් ගන්නට පුළුවන් වෙන්නේ.

බුදුරජාණන් වහන්සේ එකක් එකක් ගානේ විස්තර කරනවා. සතර මහා ධාතූන්ගෙන් හටගත්තු රූපයට විතරක් ඇළුම් කරනවා නම් කොහොම හරි මේ අසුභය වඩලා හරි නැති කරගන්නට පුළුවන්. රූපයට විතරක් නෙමේ මේ ඇළුම් කරන්නේ. වේදනාවට, විඳීමටත් ඇළුම් කරනවා.

©Mahamevnawa Monastery, Sri Lanka.
www.mahamevna.org | www.gautamabuddha.org

බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙනවා මේ විඳීමේ ඒකාන්ත දුකක් නම් තියෙන්නේ, දුකේ ම නම් වැටිලා තියෙන්නේ, සැපක් ඇත්තේ ම නැත්නම් විඳීම තුළ මේ පුද්ගලයා මේ විඳීමට ඇලෙන්නේ නැහැ. මේ විඳීමට ඇලෙන්නේ මොකද? මේකෙ සැප විඳීමක් තියෙනවා. සැපෙහි බැස ගැනීමක් තිබෙනවා. සැපෙහි වැටීමක් තිබෙනවා. ඒ නිසා තමයි මේකේ හිත බැසගන්නේ. ඒ කෙරෙහි ඇල්ම ඇති වන්නේ. එතකොට වේදනාව කෙරෙහි රාග සහිතව එකතු වීම නිසා කිළිටි වෙලා යනවා. ඔය විදිහට තමයි සත්වයා කිලිටි වෙන්නේ.

දැන් අපි ගත්තොත් රූපය කොච්චර දිර දිර ගියත් රූපයේ අසුභ පැත්ත කතා කරන්න අපි බොහොම අකමැතියි නේද? මට හොඳට මතකයි මම ඔය මුල් කාලයේ අසුභය ගැන කියද්දි හරි ප්‍රශ්න අහනවා මගෙන්. සමහර මිනිස්සු තරහා වුණා රූපයට දොස් කිව්වා කියලා. 'ඔහොම කියන්න එපා' කිව්වා 'අපි කළකිරෙයි' කිව්වා. මං කිව්වා එහෙම කළකිරෙන්නේ නෑ. බය වෙන්න එපා කිව්වා. එහෙම කළකිරෙනවා නම් රූපය ගැන නිතර දොස් දකින අය ලෝකේ ඉන්නවා. කවුද? දොස්තරවරු, ඊළඟට හෙදියන්, මේ අය කැත කුණු අතගානවා. ජරාව පේනවා. නමුත් යෝනිසෝ මනසිකාරයේ යෙදෙන තුරු රූපය ගැන කළකිරෙන්නේ නෑ.

මං කිව්වා "බය වෙන්න එපා. එකපාරට ම කළකිරෙන්නේ නෑ" කිව්වා. ඊටපස්සේ කිව්වා "ආ එහෙනම් කමක් නෑ" කියලා. ඇයි? බය මොකද මේ? කළකිරෙයි කියලා. කළකිරුණොත් අපිට මේ රූපයෙන් ලැබෙන වින්දනය අහිමි වෙයි කියලා. එතකොට ඒක තමයි අපේ මේ සාමාන්‍ය මනසේ තිබෙන ස්වභාවය. අනිත්‍යයයි කියලා කියනකොට බය වෙනවා. එහෙම කියන්න එපා කියනවා. දැන් මම දවසක් මැරිච්ච මනුස්සයෙක් ගේ පින්තූර වගයක් තිබ්බා මං ලඟ මං ඒක පෙන්නුවා කෙනෙකුට. ඒ කෙනා ඒක බලලා " හප්පා... හතුරෙකුටවත් දකින්න ලැබෙන්න එපා" කියල කිව්වා. ඉතිං මං කල්පනා කළා මෙයා නම් කවදාවත් යථාර්ථයක් කරා යන්නට දක්ෂ වෙන්නේ නෑ. අයි ඒ? අසුභ දෙය කෙරෙහි සිත යොමු කරන්නෙ ම නැනේ. ඒකට අකමැතියි. මේකට හේතුව අපේ හිත හැමතිස්සෙ ම රූපය කෙරෙහි සුභ සංඥාවේ ම බැස ගෙන

සිටීම. මේ නිසාමයි කිළිටි වන්නේ. ඉතින් විඳීමත් එහෙමයි. බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙනවා විඳීම කෙරෙහි සැපයක් තිබෙන නිසා මේ සත්වයා විඳීම කෙරෙහි ඇලෙනවා. විඳීමත් එක්ක එකතු වෙනවා. එකතු වීමත් සමඟ කිළිටි වෙනවා.

දැන් බලන්න අපි නො සිතූ පැත්තක්නේ. අපි සාමාන්‍යයෙන් කිලුටු වුණා කියලා කීවේ ඕකට නෙමෙයි නේ. අපි මේ ඇගේ කුණු කිලිටු ගෑවුනාටනේ කිළිටු වුණා කිව්වේ. බලන්න මෙතන කිලිටු වුනා කියලා පැහැදිලිව ම කියන්නේ මොකේටද? තෘෂ්ණාවටනේ. මේ රූපය කෙරෙහි රාග සහිත වීම කියලා කියන්නේ තෘෂ්ණාවටනේ. වේදනාව කෙරෙහි රාග සහිත වීම කියලා කියන්නේ තණ්හාවට. එතකොට එකතු වෙනවා, කිළිටි වෙනවා. එතකොට බුදුවරයෙක් විසින් මේක පෙන්නා දෙනකම් මේකයි කිලුට කියලා හොයා ගන්න බෑ. අපි වුනත් සිතන්නේ හොඳට වතුර ටිකක් නාලා හොඳට සබන් ටිකක් ගාලා සුදු වෙලා හොඳ වස්ත්‍රයක් ඇන්දට පස්සේ සුද්දයි කියල.

නමුත් සුළු වෙලාවකින් ඉවරයි. දැන් බලන්න අපි උදේ පාන්දරම ආවේ එහෙම නෙමේද? උදේ එනකොට හොඳට නාලා අළුත් ඇඳුම් ඇඳගෙන. දැන් මේ අළුත් ඇඳුම කිලිටි වුනේ බාහිර කුණු වලින්ද? ඇඟේ කුණු ද? ඇඟේ කුණු. ඇඟේ දාඩිය නිසා. දැන් අර ලස්සනට කොණ්ඩේ උදේට පීරගෙන එනවා. දැන් කෝ ඒ කොණ්ඩේ? දැන් ඉවරයි ඒක. දැන් අපි ඔක්කොම දාඩිය පෙරිලා, මහන්සි වෙලා. දැන් දැක්කනේ කයින් හැදිලා තියෙන දේ. නමුත් මෙහෙම තිබුණට අපි කැමති වෙන්නේ මේ කයට නෙමේ. මේ විදිහට දාඩිය ගොඩේ තියනවට නො වෙයි. අපි කැමති වෙන්නේ පිරිසිදුව ලස්සනට තියෙනවට. අපේ සිත හැමවෙලේ ම පිහිටන්නේ එතන නිසා.

බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලාට පෙන්නා දීලා තියෙනවා නාන්න දවස් 15 කට පාරක්. මේ දේශනා කරලා තියෙන්නේ කයේ ඇත්ත ස්වභාවය පෙන්වන්නයි. සමහරු මේක වැරදි විදිහට තීරණය කළා. එක බ්‍රාහ්මණ කුලයේ කෙනෙක් පැවිදි වුණා. කය පිළිකුල් කළා. එයා වැසිකිළි යනවා. හෝදන්නේ නැහැ. අනේ අප්පිරිය යි කියනවා. ටික කාලයක් ගියාම මොකද වුණේ. තුවාල වුණා. එහෙම කරන්න එපා කිව්වා බුදුරජාණන් වහන්සේ.

©Mahamevnawa Monastery, Sri Lanka.
www.mahamevna.org | www.gautamabuddha.org

පිරිසිදු කරන්න ඕන. නමුත් නාන එක විතරක් අර විදියට කරන්න. එතකොට ස්වාමීන් වහන්සේ නමක් ඉල්ලා සිටියා බුදුරජාණන් වහන්සේගෙන් එක පළාතක නිතර නානවා. නාන්නේ නැත්නම් බනිනවා කියලා. "ආ... එහෙනම් ඒ පළාතේ නැවට කමක් නෑ" කිව්වා. එතකොට දවස් පහලොවක් නොනා ඉන්න කොට, දැන් බලන්න දවසක් , දෙකක් නොනා ඉන්නකොට අපිට තේරෙනවානේ මේ ශරීරය අපිට ම, අපිව ගඳයි. මේ ඇඳුම අපිට ම ගඳයි. දවසක්, දෙකක් එක දිගට ඇඳගෙන සිටියොත්.

එතකොට බලන්න අපි මේ ශරීරයේ ස්වභාවය දකින්නේ නැහැ. ඒක අපි ඒ සැණින් අමතක කරලා පරණ තැනට ම එනවා. රූපයේ ඇලී වාසය කරනවා. විඳීමත් ඒ වගේම තමයි කියනවා. ඒ නිසා තමයි කියනවා සත්වයන් කිලිටි වන්නේ. මොකද හේතුව සිහිය පිහිටන්න දක්ෂ වෙන්නේ නැනේ. එතකොට ඇලුනාට පස්සේ සිහිය පිහිටුවලා තියෙන්නේ මොකේද? අර ඇලිච්ච එකේ. මේ ඇලීම සතිපට්ඨානයේ විස්තර කරන්නේ කොහොමද? **(සතිමා විනෙය්‍ය ලෝකේ අභිජ්ඣා දෝමනස්සං)** ඇලීමයි, ගැටීමයි දුරු කරලා සිහියෙන් බලන්න කියලා. දැන් එතකොට රූපයට ඇලුණු කෙනාට පෙනෙන්නේ රූපය. වේදනාවට ඇලුණා නම් සිහිය පිහිටෙව්වට ඇලීම තුළ නම් මෙයා ගේ සිත තියෙන්නේ කිළිටි වෙන එක නවත්වන්නට බැහැ. මොකද සතිපට්ඨානය තුළ තිබෙන්නේ ඇලීමෙන්, ගැටීමෙන් තොරව සිහිය පිහිටුවීම. එතකොට තමයි එයාට ඒකේ ඇත්ත ස්වභාවය පේන්න පටන් ගන්නේ.

ඉතිං බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා මේ විඳීමේ සැපයක් තියෙන නිසා ආශා කරනවා. රාග සහිත වෙනවා. ඊළඟට රාග සහිත වීම නිසා කිලිටු වෙනවා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා ඔන්න ඕවා තමා සත්වයන් කිළිටි වීමට හේතු, හැබැයි අපිට මේ වගේ බුද්ධ දේශනා අහනකම් දැනුනේ නැහැ. අපි හිතන්නේ කිලිටි වෙන්නේ වෙන වෙන හේතු නිසා කියලා. මේකේ පැහැදිලිව ම දේශනා කරනවා කිලිටි වීමට කාරණා.

බුදුරජාණන් වහන්සේ වදාළා වේදනාව ගැන. ඇසේ ස්පර්ශයෙන් හටගන්නවා වේදනාව, කණේ ස්පර්ශයෙන් හටගන්නවා වේදනාව, නාසයේ ස්පර්ශයෙන් හටගන්නවා වේදනාව, දිවේ

©Mahamevnawa Monastery, Sri Lanka.
www.mahamevna.org | www.gautamabuddha.org

ස්පර්ශයෙන් හටගන්නවා වේදනාව, කයේ ස්පර්ශයෙන් හටගන්නවා වේදනාව, මනසේ ස්පර්ශයෙන් හටගන්නවා වේදනාව.

දැන් අපි ගත්තොත් අපි තමන් ආශා කරන සිංදුවක් යනවා කියමුකෝ රේඩියෝ එකේ. දැන් තමන් මේක හොඳට අහගෙන ඉන්නවා. දැන් එතකොට කණේ ස්පර්ශයෙන් හටගන්නේ මොකක් ද? සැප විඳීම හටගන්නවා. ඒකයි එයා ඒකට ආශා කරන්නේ. කෙනෙක් ඇවිල්ල එකපාරට ම ඒකවහලා දානවා. එතකොට අරයා මොකද කියන්නේ? "දාන්න. දාන්න මම දැන් ඔය අහ අහා ඉන්නේ" එයා ඒක දැම්මේ නැත්නම් කේන්ති යනවා, අර වින්දනය තමන්ට නැති වුනා කියලා. රූපවාහිනියක් තියෙනවා, තමන් ආසා කරන ගායකයෙක්, නළුවෙක් එක්කො ගායිකාවක් හරි කවුරු හරි මොකක් හරි එකක් එයා බලනවා. ඇහේ ස්පර්ශයෙන් හටගන්න විඳීමක් තමයි තියෙන්නේ. දැන් මෙයා බල බලා ප්‍රීති වෙවී ඉද්දි කෙනෙක් ඇවිල්ලා චැනල් එක මාරු කරනවා. එයා මොකද කියන්නේ? "ඕක දාන්න. තමන්ට ඕන දේ බලන්න බැරි නම් ටීවී තියාගෙන මොකට ද?" කියලා එයා කෑ ගහනවා. සමහර විට එයා ඒක සිතේ බැඳගන්නවා වෛරය හැටියට ඊටපස්සේ.

එතකොට අපිට පේනවා මේ විඳීමට වසඟ වුණාට පස්සේ සත්වයා කිලිටි වෙන්න පටන් ගන්නවා. දැන් මේක සරළ වගේ කතා කළාට එතෙර වෙන්න අමාරු දුෂ්කර දෙයක්. බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙන්නේ තණ්හාව සැඩ පහරක් හැටියට. උන්වහන්සේ ඒ සැඩ පහර වියළවන්න කියනවා. වේලලා දාන්න කියනවා. ඉතිං වේලලා දාන්න කොච්චර උණුසුමක් ඕන ද? ගඟක් වේලන්න එක දිගට පායන්න එපායැ. ඒ වගේ තමයි මේ තණ්හාව. අපි මේ සිතන ලේසියෙන් වේලෙන්නේ නෑ. මේ තණ්හාව සිතේ නැති වුණා වගේ සිතුනත්, තණ්හාව හටගන්න වෙලාව තමන්වත් දන්නෙ නෑ.

හොඳම සිද්ධිය තමයි අර පොඩි හාමුදුරුවොයි, ගුරු හාමුදුරුවොයි රුවන්වැලි සෑය වඳින්න ගිහිල්ලා වෙච්ච දේ. වඳින්න ගිහිල්ලා මල් පූජා කරන්නට ඕන වුණා ගුරු හාමුදුරුවන්ට. "ස්වාමීන් වහන්ස, මල් තිබුණොත් හොඳයි ද මල් පූජා කරන්න?" "ආ... හොඳයි" කියලා කිව්වා. පොඩි ස්වාමීන් වහන්සේ ටික වේලාවකින් ගෙනාවා පෙරහන් කඩයක් පුරවලා තෙත, හොඳට සීතල මල්. මේ මල් වලින්

©Mahamevnawa Monastery, Sri Lanka.
www.mahamevna.org | www.gautamabuddha.org

වතුර වැක්කෙරෙද්දි මේ ස්වාමීන් වහන්සේ පේසා වළල්ලේ වටේට තියා ගෙන යනවා, ඉවර වෙන්නේ නැහැ. ඊට පස්සේ කිව්වා. " පොඩි නම මේකෙ මල් නම් ඉවර වෙන්නේ නැහැ නෙව." "ස්වාමීනි, පෙරහන් කඩ මුණින් අතට නවලා ගසන්න" ගැසුවට පස්සේ මල්ටික වැටුණා. ඊට පස්සේ මේ ගුරු ස්වාමීන් වහන්සේ ඇහැව්වා. "පොඩි නම කොහෙන් ද මල් ගෙනාවේ?" "ස්වාමීනී, මේ මල් ටික ගෙනාවේ අනෝතත්ත විලෙන්"

ඉතින් ගුරු හාමුදුරුවෝ බැලුවා මෙයා ගේ අනාගත දක්ෂතාවයට මොකද වෙන්නේ කියලා. බැලුවාම දැනගත්තා මෙයා විශාල විපතකට පත්වෙනවා. "පොඩි නම ඕකට රැවටෙන්න එපා. ඕකට තමන් බේරුනා කියලා හිතන්න එපා. තමන් නුවණින් කල්පනා නො කළොත් නම් ඇහැක් කණ වෙච්ච කාන්තාවක් දෙන කැඳ ටික බීලා ඉන්න වෙයි" කිව්වා. මෙයා පිළිගත්තේ නැහැ. "මට මෙහෙම ඍද්ධි තියෙන එකේ මට මොනවා වෙන්න ද?" නමුත් එයා දන්නේ නෑ වේදනාවට, විඳීමට සිත ඇලෙන වෙලාව.

මෙයා දවසක් අහසින් යනකොට මිහිරි හඬින් ගීතයක් ගයනවා. ඔන්න ඉතිං ඇහුනා. ස්පර්ශ ප්‍රත්‍යයෙන් විඳීම හටගත්තා, ඇලුනා, මෙයා හෙමීට පාත් වුනා. ඔන්න ඍද්ධිය ඉවර වුනා. ඊට පස්සේ ඒ ගෙදර ගිහිල්ලා පදිංචි වුණා. යුද්ධයෙන් පැරදුනා. සේනාවෙන් ඉවත් වුණා. ඊට පස්සේ මේ කොහේ ගෙයක් ද? පේෂකාර ගෙයක්. නූල් කටින රස්සාව කරන ගෙයක්.

දැන් ඉතින් දවල් වෙලා මෙයාට බඩගිනියි. මෙයත් නූල් කැටලා කෑම වේල ගෙනාවේ නැහැ. එතකොට මෙයාට කේන්ති ගියා. දැන් ඔන්න ඈත ඉඳන් මේ කාන්තාව එනවා. එනකොට "මොකද මෙච්චර වෙලා කළේ? කෑම ප්‍රමාද කරගෙන" කියලා නූල් කටින කටුවෙන් ගැහුවා. ඒක ගිහිල්ලා වැදුනේ කොහේද? ඇහේ. ඇහැ අල්ලගෙනම පාත් වෙන කොට තමයි මතක් වුණේ ගුරු හාමුදුරුවන්ගේ උපදේශය. උපදේශය ලැබිච්ච වෙලාවේ කළා නම් හරි. මේ වෙනකොට කරන්න බෑ. ප්‍රමාද වෙලා වැඩියි.

එතකොට අපිට පේනවා මේ සත්වයා කිලිටි වෙන විදිය සුළු දෙයකින්, සුළු නො සැලකිල්ලකින් ලොකු කිලුටක් වෙලා ඉස්සරහට

©Mahamevnawa Monastery, Sri Lanka.
www.mahamevna.org | www.gautamabuddha.org

යනවා. බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙනවා කිලිටි වීම සිදුවන්නේ විඳීම කෙරෙහි රාග සහිත වීමෙන්. එයට එකතු වීමෙන් ඒ තුළ බැස ගැනීමෙනුයි සිදුවෙන්නේ.

ඊළඟට බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙනවා සංඥාව ගැන. ඇසේ ස්පර්ශයෙන් රූප හඳුනාගන්නවා. කණේ ස්පර්ශයෙන් ශබ්ද හඳුනාගන්නවා. නාසයේ ස්පර්ශයෙන් ගඳ සුවඳ හඳුනාගන්නවා. දිවේ ස්පර්ශයෙන් රස හඳුනාගන්නවා. කයේ ස්පර්ශයෙන් පහස හඳුනාගන්නවා. මනසේ ස්පර්ශයෙන් අරමුණු හඳුනාගන්නවා.

බුදුරජාණන් වහන්සේ දේශනා කළා මේ සංඥාව තුළ ඒකාන්ත වශයෙන් ම දුකක් නම් තියෙන්නේ, දුකේ නම් බැසගෙන තියෙන්නේ කවදාවත් සැපක් නැත්නම්, සංඥාවට සත්වයෝ කවදාවත් ඇලෙන්නේ නෑ. නමුත් මේ සත්වයෝ සංඥාවට ඇලෙනවා, මේකේ සැපක් තියෙන නිසා. නමුත් සංඥාවේ ඇත්ත ස්වභාවය මිරිඟුවක් වගේ එකක්. මේක මේ ඇලෙන්න තරම් විශේෂ දෙයක් නැහැ. නමුත් අපට පේන දේ තුළ ඇලෙනවා.

අර **තාලපුට රහතන් වහන්සේ** සිතට බනින වෙලාවේදී හිතට බනිනවා, "ඒයි හිත, නුඹ මාව රැවෙට්ටුවේ අසුභ දේ සුභ විදියට පෙන්නලා, අනිත්‍ය දේ නිත්‍ය විදියට පෙන්නලා, දුක් දේ සැප විදියට පෙන්නලා, අනාත්ම දේ ආත්ම විදියට පෙන්නලා. ඒ විදියටයි නුඹ මාව රැවෙට්ටුවේ." දැන් ඔය හිතේ රැවටීමට අපි අහුවෙලා නැද්ද? අහුවෙලා තියෙන්නේ. දැන් අපි කොච්චර සංඥාව අනිත්‍යයි කිව්වත්, කවුරු හරි ලස්සන කෙනෙන් දැක්ක ගමන් අපේ හිතට එකපාරටම එන්නේ මොකක් ද? ලස්සන යි. හිතෙන්නෙ නැද්ද? කැත කෙනෙක් දැක්ක ගමන් ම කැතයි කියලා හිතෙනවානේ. අපිට හිතෙනවාද මේ සංඥාව අනිත්‍යයි කියලා. එකපාරට ම අපි බලෙන් තමයි පස්සේ ඒක හිතලා ගන්න ඕන. නැත්නම් දැක්ක ගමන් හිතෙන්නේ 'ෂා... ලස්සනයිනේ' කියලා.

එතකොට අපිට පේනවා අපි හැම වෙලාවෙම ඉන්නේ සංඥාව තුළ සැපයට ඇලුම් කරමින්. මොකද ඒ ලස්සනයි කියලා කියන්නේ අපේ හිත ඒකෙ බැඳිලා. හොඳට බලන්න අපි යමකට ලස්සනයි කියලා කියනවා ද ඒකත් එක්ක අපේ හිත එක් වෙනවා.

©Mahamevnawa Monastery, Sri Lanka.
www.mahamevna.org | www.gautamabuddha.org

ඊටපස්සේ සිත කිලිටි වෙලා යනවා. බුදුරජාණන් වහන්සේ දේශනා කරපු මට්ටමට හිත ගන්න නම් පුදුම දක්ෂකමක් ඕන. ඉතින් බුද්ධ දේශනා වලින් ම තමයි ඒ දක්ෂකම එක එක්කෙනා නුවණින් මෙනෙහි කරමින්, නුවණින් මෙනෙහි කරමින් ඇති කරගන්නට තියෙන්නේ.

බුදුරජාණන් වහන්සේ ගේ දේශනාවක් තියෙනවා. ඒ තමයි උන්වහන්සේ වදාළා "පින්වත් මහණෙනි, මේ ලෝකේ යම්තාක් සතුන් ඇද්ද ඒ සතුන් ගේ සියළුම පියවර සටහන් ඇතා ගේ පියවර සටහනට දමන්න පුළුවනි. මේ වගේ යම්තාක් කුසල් ඇද්ද ඒවා එක වචනයක් ඇතුළට දාන්නට පුළුවන්. ඒ වචනය තමයි 'අප්‍රමාදය' කියන වචනය." මොකද නැත්නම් ඇලෙන ඇලෙන එකට වසඟ වෙනවානේ. ඊටපස්සේ අපි ඒකනේ හිතන්නේ. එතකොට ඉන්නේ ප්‍රමාදය තුළ ද, අප්‍රමාදය තුළ ද? ප්‍රමාදය තුළ. ප්‍රමාදය තුළ ඉන්න නිසා තමයි මේ මැරි මැරී යන්නේ. බුදුරජාණන් වහන්සේ අප්‍රමාදය ම තමයි ප්‍රශංසා කරලා තියෙන්නේ. එතකොට අප්‍රමාදී වෙන්න නම් එයාට මොනවද තියෙන්න ඕන? හොඳ වීර්යයක් තියෙන්න ඕන. හොඳ නුවණක් ඕන. හොඳ සිහියක් ඕන. ඉතින් අඩු ගණනේ මේ දක්ෂතාවය තිබෙන එක්කෙනා හරි අල්ල ගන්නවා. මොකද මේ කතා කරන ඒවා අපතේ යනවා කියලා කියන්නට බැහැ. ඒ දක්ෂතාවය තියෙන එක්කෙනෙක් හරි මේ ධර්මය අල්ල ගන්නවා.

මේ යුගයේ එක් කෙනෙක් හරි මඟ ඵල ලැබුවොත් මට නම් හිතෙන්නේ ඒක හාස්කමක් කියලා. ඒ කියන්නේ එච්චරට ම මේ යුගයේ දුෂ්කරයි. අනිත් එක ඉදිරියට යන්න යන්න මනුෂ්‍ය ජීවිත වල තියෙන්නේ නුවණින් විමසීම නෙමේ, අධර්ම රාගයයි, විෂම ලෝභය යි. එතකොට මනුෂ්‍යයන් මේ ලෝකයේ තියෙන ප්‍රශ්නවලට පැටලි පැටලී යනවා මිසක් කවුරුවත් හිත පිරිසිදු කරන වැඩපිළිවෙලට එන්නේ නෑනේ. හිත පිරිසිදු කරන වැඩපිළිවෙලට එන්නේ නුවණින් කල්පනා කරන්න පුළුවන් හොඳ නරක දෙක තේරුම් ගන්න පුළුවන් යෝනිසෝමනසිකාරයේ අයෝනිසෝ මනසිකාරයේ මේ දෙකේ වෙනස දැනගන්න පුළුවන් අයට. අනෙක් අයට එන්න පුළුවන් කමක් නෑ. ඒ නිසා විශේෂ වාසනාවක් දක්ෂකමක් තියෙන්න ඕන මෙවන් යුගයක ධර්මය තමන්ට නුවණින් විමසලා විමසලා තේරුම් ගන්නට. එතකොට අපි මේ සංඥාවට

©Mahamevnawa Monastery, Sri Lanka.
www.mahamevna.org | www.gautamabuddha.org

ඇලීමෙන් කිළිටි වන බව බුදුරජාණන් වහන්සේ ගේ දේශනාවෙන් අපි අවබෝධ කරගන්නට ඕන.

ඊළඟට සංස්කාර. සංස්කාර වල ඒකාන්ත දුකක් තිබුණා නම් සැපක් නො තිබුනා නම් මේ සත්වයෝ ඇලෙන්නේ නැහැ. මේ සංස්කාරයන් ගේ සැපක් තියෙනවා. ඒ නිසයි සත්වයෝ සංස්කාර වලට ඇලෙන්නේ. සංස්කාර ගැන නුවණින් කල්පනා කළොත් අනිත් ඒවාට වඩා ඉක්මනට තේරුම් ගන්න පුළුවන් එකක් කියලා.

ඒ කියන්නේ දැන් බලන්න බුදුරජාණන් වහන්සේ පෙන්නා දී තිබෙන උපමාව මොකක් ද? කෙහෙල් අරටුවක් වගේ සිතා ගෙන, ඔන්න බලන්න තව ටික දවසකින් අවුරුද්ද එනවා. බලන්න සෙනඟ හාල්, පොල් ගන්න දුවයි සති ගාණක් කාලා නෑ වගේ, පෝලිමේ ඉඳියි රෙදි කඩවල අවුරුදු ගාණක් කොළ අතු ඇඳගෙන හිටියා වගේ. මේ මොකේට ද මේ මහා ගජරාමේට ලෑස්ති වෙන්නේ? එක දවසක් කාලා බීලා ඉන්න. ඊට පස්සේ පහුවදා වුන ගමන් ඉවරයි. කෙහෙල් පතුර ගැලේව්වා. එයා දන්නේ නෑ, අරටුව නැති බව. එයා හිතන්නේ ඊළඟ පතුර ගලවපුවා ම අරටුව හම්බ වෙයි කියලා. මේ වගේ තමයි අපි දිගින් දිගටම ආවේ.

බුදුරජාණන් වහන්සේ ගේ ජීවිතය තුළ උන්වහන්සේ කොහේවත් දේශනා කරලා තියෙනවා ද "පින්වත් මහණෙනි, මට දැන් අවුරුදු 70ක් නේ" කියලා උපන්දිනේ සිහි කරලා තියෙනවා ද? නැහැ. රහතන් වහන්සේලා උපන්දින සමරනවාද? මොකුත් නෑ නේ. දැන් බලන්න අපි සංස්කාර වලට අහුවෙලා තියෙන හැටි. අපි ඉපදිච්ච දවස සිහි කර කර මහා ලොකු දේවල් කරලා ඒවා අතීතයට දානවා. ලොකු මහන්සියක් අරගෙන වැඩිපුර කරන්නේ කන එකනේ. හොඳට හිතලා බලන්න. ලොකු සන්තෝෂයක් වුණත් අපි කරන්නේ කන එක. කවුරු හරි ආවත් කෑම. මොනවා හරි කරලා අර්ථයක් නැති ගමනක යෙදෙනවා.

මේක මම බුද්ධ දේශනා වලින් තේරුම් ගත්ත දා ඉඳලා මම කවුරුත් මගේ උපන්දිනේ සිහි කරනවාටත් කැමති නෑ. මම දන්නවා එදා තමයි දුක මේ ජීවිතයේ පටන්ගත්ත දවස. ඒනිසා මට මේකේ ඉපදුනා කියලා සතුටු වෙන්න දෙයක් නැහැ. යෝනිසෝ

©Mahamevnawa Monastery, Sri Lanka.
www.mahamevna.org | www.gautamabuddha.org

මනසිකාරයෙන් යමක් ගත්ත නම් අන්න එතනයි සතුටු වෙන්න තියෙන්නේ. ආනන්ද ඒ නිසා හොඳට සංස්කාර ගැන නුවණින් විමසන්න පටන් ගත්තොත් නිසරුකම තේරුම් ගන්න පුළුවන් වේවි. මේ බුදුරජාණන් වහන්සේලා කොහොමද කියලා මේ සාමාන්‍ය ලෝකයට තේරෙන්නේ නැහැ. සාමාන්‍ය ලෝකයා හිතන්නේ "ආ! එයා අමුතු එක්කෙනෙක්. එයාට මේ ලෝකේ කිසි සැපක් පේන්නේ නැහැ." නමුත් බැලුවට පස්සේ නියම සැප සොයා ගෙන යන්නේ ඒ නිසයි.

ඊළඟට බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා විඤ්ඤාණය. විඤ්ඤාණයේ සැපක් නො තිබුණා නම් දුකක් විතර නම් තිබුණේ මේ සත්වයෝ මේ විඤ්ඤාණයට ඇලෙන්නේ නැහැ. සත්වයෝ විඤ්ඤාණයට ඇලිලා ඉන්නවා සැපක් තියෙන නිසා. අපි දන්නෙත් නැනේ විඤ්ඤාණයට ඇලී ඉන්න බව. අපිට තේරෙනවා නිකම් කයට නම් ඇලී තියෙන බව. වේදනා, සංඥා, සංස්කාර, විඤ්ඤාණ වලට ඇලිල ඉන්න බව තේරෙන්න නම් නුවණින් ම විමසන්න ඕන. නැත්නම් ඒක ඇලිලා තියෙනව ද කියලවත් හොයන්න බැහැ. ඒ නිසා නුවණින් විමස විමසා බලද්දි තේරෙනවා ඔන්න බුදුරජාණන් වහන්සේ මහාලිට දේශනා කළා "මහාලි, ඔන්න ඔය විදියටයි සත්වයන් කිළිටි වෙන්නේ".

දැන් බලන්න අපි සංසාර ගමනේ ඉපිද ඉපිද ඇවිල්ලා දැන් මනුෂ්‍ය ලෝකෙට ඇවිල්ලා ඉන්නවා. දැන් සමහරු හිතාගෙන ඉන්නේ මහ විශාල එකක් වගේ. මේ මනුෂ්‍ය ජීවිතයේ දී තමයි අපිට විඳින්න තියෙන හැම සැපක් ම විඳින්න තියෙන්නේ කියලා. අයේ ලෝක නෑ කියලා. නමුත් අපිට හොඳට තේරෙනවා පංච උපාදාන ස්කන්ධයට ඇලුණු නිසා කිළිටි වෙලා ගිහිල්ලා. එකයි වෙලා තියෙන්නේ. ඒ නිසා අපි අවබෝධ කරගන්නට ඕන පංච උපාදාන ස්කන්ධය කෙරෙහි රාග සහිත වීමෙන් කිළිටි වෙනවා.

බුදුරජාණන් වහන්සේගෙන් මහාලි අහනවා "ස්වාමීනී, මේ සත්වයා පිරිසිදු වෙන්නේ මොකෙන් ද?" බුදුරජාණන් වහන්සේ වදාළා "**(රූපඤ්ච හිදං මහාලි, ඒකන්තසුඛං අභවිස්ස)** පින්වත් මහාලි, මේ රූපයේ ඒකාන්ත සැපයක් විතරක් තිබුණා නම්, **(සුඛානුපතිතං)** ඒකාන්ත සැපයේ බැසගෙන තිබුණා නම්, **(සුඛාවක්කන්තං)** සැපයේ

©Mahamevnawa Monastery, Sri Lanka.
www.mahamevna.org | www.gautamabuddha.org

වැටිලා තිබුණා නම්, **(අනවක්කන්තං දුක්ඛේන)** දුකක් නො තිබුණා නම්, **(නයිදං සත්තා රූපස්මිං නිබ්බින්දෙය්‍යුං)** සත්වයෝ මේ රූපය කෙරෙහි කළකිරෙන්නේ නැහැ" කළකිරෙනවාට කියන වචනය තමයි **'නිබ්බින්දති'** එතකොට මේ රූපයේ දුකක් තිබෙන නිසා, සැපයේ බැස නො ගත්තු නිසා, සත්වයන් රූපය කෙරෙහි අවබෝධයෙන් කළකිරෙනවා.

දැන් අපි මේ පාලි භාෂාව සිංහලයට හැරවීමේ දී මට තවමත් සිංහලයට හරවන්න බැරි වචනයක් තමයි **'නිබ්බින්දති'** කියන වචනය. අපි ඒක සාමාන්‍යයෙන් කියන්නේ කළකිරෙනවා කියලා. සිංහලයේ දී කළකිරෙනවා කියන වචනයේ ගැඹුරු අර්ථයක් නෑ. සිංහලයේ දී අපි කළකිරෙනවා කියලා කියන්නේ අපට නිකම් එපා වෙලා තියෙනවා කියන එක. මොහොතෙ දී අපිට ඒ කළකිරීම නැති වෙලා යනවා.

දැන් ඔන්න අපි කළිකිරිලා ඉන්නවා, ඔන්න අපට ඉල්ලපු දේ දුන්නේ නැහැ. ගෙනල්ලා දුන්නා. එයා ආපහු කළකිරීම ඉවරයි. දැන් ඔන්න අපි අසනීපයෙන් ඉන්නවා. සනීප වුණා. කළකිරීම ඉවරයි. ඔන්න කවුරුහරි බැන්නා. ඊට පස්සේ එයා ඇවිල්ලා සමාව ගන්නවා. අරන් ප්‍රශංසා කළා. කළකිරීම ඉවරයි. එතකොට දැන් මේ කළකිරෙනවා කියන්නේ ඒ වගේ එකක් ද? ඒ නිසයි මම අවබෝධය කියන වචනය ඉස්සරහට දැම්මේ. නමුත් මේක නියම විදියට ම තෝරනවා නම් 'රූපයේ ඇත්ත ස්වභාවය ඒ ආකාරයෙන් ම වෙනස් නො වන පරිදි තේරුම් අරගෙන එපා වෙනවා.' ඒ වගේ අර්ථයක් තමයි මේ **නිබ්බින්දති** කියන වචනයේ ගැඹුරු අර්ථය. ඒ කියන්නේ ඒක නියම විදියට අවබෝධ වුනා නම් ඒ අවබෝධය වෙනස් වෙන්නේ නැහැ.

දැන් අර ධූර්තයා සුභා තෙරණියට එක එක ඒවා කියමින් වර්ණනා කරනවා. 'දැන් මේක කිව්වාම හරියයි, මේක කිව්වම හරියයි' කිය කියා එක එක වර්ණනා කරනවා. වර්ණනා කරද්දි එතුමිය මොකක් ද කිව්වේ? "මට තේරෙන්නේ නැහැ ඔය කියන දේවල්" කිව්වා. කොච්චර කීවත් දකින්නේ කුණු කය විතරයි. බලන්න වෙනස. එතකොට ඒක තමයි නිබ්බින්දති. ඒක ඤාණයක්. නැත්නම් සාමාන්‍ය ජීවිතයේ දී තියෙන්නෙ අපේක්ෂා භංගත්වයක් විතරයි. මෙතන

©Mahamevnawa Monastery, Sri Lanka.
www.mahamevna.org | www.gautamabuddha.org

කියන්නේ මේ හේතු-ඵල ස්වභාවය ඒ විදියට ම අවබෝධ කර ගෙන ඇති වෙච්ච අවබෝධ ඥාණය. **(නිබ්බින්දං විරජ්ජති)** අන්න ඒ අවබෝධ ඥාණය ඇති වුණාට කවදාවත් ඒකට ඇලෙන්නේ නෑ. ඒ කෙරෙහි ඇති ඇල්ම නිරුද්ධ වෙලා යනවා. **(විරාගා විසුජ්ඣන්ති)** ඇල්ම දුරුවීමෙන් පිරිසිදු වෙනවා. කොච්චර ලස්සන එක්කෙනෙක් පෙනී සිටියත් ඇල්ම ඇති වෙන්නේ නැහැ.

මුගලන් මහරහතන් වහන්සේ පොළඹවා ගන්න ආවානේ විමලා කියන කාන්තාව. ඇවිල්ලා දාන්න පටන් ගත්තා මායම් ටික. මුගලන් මහරහතන් වහන්සේ කලබල වුණා ද? "මෝඩ ගෑණි, නුඹ ආකාසේ චිත්‍ර අඳින්න හදනවාද? නුඹට පුළුවන් ද මේ හුළඟ නවත්වන්න. දන්නවා ද මේ කයේ හැටි. මේ කය හොඳයි බාලයාට. ජීවිතාවබෝධය නො කරන අයට නම් ඔය නැටුම් හරි. අපට වැඩක් නැතේ කීවා ඔය නැටුම්." එතකොට අපිට තේරෙනවා මොනයම් ආකාරයේ දෙයක් ඉදිරියට ආවත් අවබෝධ වෙච්ච දේ වෙනස් වෙන්නේ නෑ. ආන්න ඒක තමයි මෙතැන කියන නිබ්බින්දති කියන එක. ඒ කීමට තමයි අර විමලා කියන ඒ වෙසඟන ධර්මයට ආවේ. ඈ එකපාරටම කිව්වා "හරිම පුදුම වීරෝධාර මනුෂ්‍යයෙක්නේ තමුන්නාන්සේ".

නිබ්බින්දති කියලා කියන්නේ අනිත්‍ය වශයෙන්, දුක් වශයෙන්, අනාත්ම වශයෙන් විමසද්දි ඇති වන යථාභූත ඥාණය නිසා ඇතිවන කළකිරීම යි. යථාභූත ඥාණය නැතිව අපට ඇතිවන කළකිරීම ඇත්ත කළකිරීමක් නෙමේ. යථාභූත ඥාණයෙන් තමයි එන්න ඕන ඒ කළකිරීම. එතකොට ඇලෙන්නේ නැහැ. ඇල්ම දුරුවීමෙන් නිදහස් වෙලා යනවා.

බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙනවා රහතන් වහන්සේ පුළුවන් ද රූපයට අලවන්න? කණෙන් ඇහෙන ශබ්දයට අලවන්න පුළුවන් ද? දූන් එක තැනක තියෙනවා. **අනුරුද්ධ මහරහතන් වහන්සේ** දිවැස් ලාභීන් අතරින් අග්‍රයි නෙ, මනෝකායික මනාපකායික දිව්‍යලෝකේ ඉන්න දිව්‍යාංගනාවක් ඇවිල්ලා අනුරුද්ධ මහරහතන් වහන්සේට කියනවා. "ස්වාමීනී, අපි මනෝකායික, මනාපකායික දෙවියන්. අපි කරුණු තුනකින් ඉසුරුමත් වෙලා ඉන්නවා. අපිට පුළුවන් ඕන ඕන විදියෙන් මිහිරි ස්වරයෙන් කථා කරන්න. අපිට

©Mahamevnawa Monastery, Sri Lanka.
www.mahamevna.org | www.gautamabuddha.org

කැමැති විදියෙන් සැප උපදවා ගන්නට පුළුවන්" කිව්වා.

අනුරුද්ධ මහරහතන් වහන්සේ හිතුවා 'මෑ ලා නිල් පාට වේවා.' සිතපු ගමන් අර ඔක්කෝම නිල්පාට වුණා. නිල්පාට සළු පිළි, නිල්පාට කොණ්ඩ, නිල් පාට මල්, ඊට පස්සේ අනුරුද්ධ මහරහතන් වහන්සේ සිතුවා 'මෑ ලා කහපාට වේවා' කියලා. සිතපු ගමන් අරගොල්ලෝ එකපාරටම කහ පාට වුණා. කහ පාට වෙලා, කහපාට සළු පිළි, කහ පාට මල් පැළඳගෙන ඉන්නවා. ඊටපස්සේ අනුරුද්ධ මහරහතන් වහන්සේට හිතුනා 'මෑලා සුදු පාට වේවා' කියලා. සුදුපාට වුන ගමන් මොකද කරන්න ගත්තේ. එකකෙනෙක් අත්පුඩි ගහන්න පටන් ගත්තා. එක්කෙනෙක් සිංදු කියන්න පටන් ගත්තා. එක්කෙනෙක් නටන්න පටන් ගත්තා. අනුරුද්ධ මහරහතන් වහන්සේ මේ මොකද මේ කියලා සිත අයින් කළා. සංඥාව අයින් කළා. ඒකට සිත යොමු කරන එක වෙනස් කළා. වෙනස් කළා ම ඇලා බැලුවා. හරියන්නේ නැහැ දූන් වැඩේ. මේ ස්වාමීන් වහන්සේ බලන්නේ නැහැ. අතුරුදහන් වුණා.

බුදුරජාණන් වහන්සේට ගිහිල්ලා කිව්වා. "ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, හරි වැඩක් වුණානේ. අද මෙහෙම මේගොල්ලෝ ආවා. නටන්න පටන් ගත්තා. මම හිත යොමු කළේ නෑ. එතකොට ඒගොල්ලෝ අතුරුදහන් වුණානේ." බුදුරජාණන් වහන්සේ වදාළා " ඔයගොල්ලො ඉපදිලා ඉන්නේ මනාපකායික කියන දිව්‍ය ලෝකෙ. මේ මිනිස් ලෝකේ ඉද්දි තිසරණය සහිතව අෂ්ඨාංග උපෝසථ සීලය රැකගත්ත අය තමයි ඔය ඉපදිලා ඉන්නේ" කිව්වා.

එතකොට අපිට පේනවා ඒ රූපය කෙරෙහි ආශ්වාදයේ බැස ගත්තාම තමයි කිලුටු වෙන්නේ. ඒ ආශ්වාදයේ බැසගෙන නැත්නම් කිලිටි කරන්න බැහැ කාටවත්. ඒකනේ රහතන් වහන්සේට ලෝකේ කාගෙන්වත් අභියෝගයක් නැත්තේ. කාටවත් තරහා උපද්දවන්නත් බැහැ. ඇල්මක් උළුද්දවන්නත් බෑ. එතකොට බලන්න මේ අවබෝධය අපට හිතාගන්න බැරි අවබෝධයක්. ඒ අවබෝධය තමයි අපේ ජීවිතේ ඉලක්කය වෙන්නට ඕන.

ඉතින් බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා මහාලිට " පින්වත් මහාලි, මේ විඳීම් ඒකාන්තයෙන් ම සැපයක් වුනා නම්, මේ

©Mahamevnawa Monastery, Sri Lanka.
www.mahamevna.org | www.gautamabuddha.org

සත්වයන් විඳීමේ කළකිරෙන්නේ නැහැ. කළකිරෙන්නේ මේකේ ඒකාන්ත සැපයක් නෙමෙයි. මේකේ දුකක් තියෙනවා" දැන් ඔබ ම කල්පනා කරලා බලන්න ඔබ ගේ ජීවිතයේ ඔබ විඳපු දේවල් ඔක්කෝම එකට අරගෙන දෙපැත්තකට දැම්මොත් සැප දුක කියලා වැඩි කොයි පැත්ත ද? කායික මානසික යම් විඳීමක් වින්ඳා නම් ඒ විඳීම් අතර සැප දුක කියන දෙපැත්තට දැම්මොත් වැඩි දුක නේද? නමුත් ඔබේ හිත යන්නේ නිතර නිතර අර සැප විඳීමට. එතකොට අපි අවබෝධ කරන්න ඕන විඳීම අනිත්‍යයි කියලා.

බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙනවා මේක තේරුම් ගන්න කියලා මේ විදියට. වතුර එකකට වැහි බිඳු වැටෙනවා. ඔන්න තව වැහි බිංදුවක් වැටෙන කොට ඒ දිය බිංදු බිඳිලා වෙන එකක් හටගන්නවා. ඊළඟ වැහි බිංදුව වැටෙනකොට ඒක බිඳිලා තව එකක් හටගන්නවා. ස්පර්ශය වෙනස් වෙනකොට විඳීම වෙනස් වෙන්නෙත් මේ වගේ. මේක නුවණින් තේරුම් ගත්ත එක්කෙනාට විඳීම ගැන යථාභූත ඤාණය ඇති වෙනවා 'විඳීම අනිත්‍යයි' කියලා. මේක මේ හේතු ප්‍රත්‍යයන්ගෙන් හටගත්ත එකක් කියලා යථාභූත ඤාණය නිසා, ඒ ආකාරයෙන් ම අවබෝධ වීම නිසා ඒ කෙනාට ඒ ආකාරයෙන් ම එපාවීමක් ඇතිවෙනවා. ඒ එපාවීම ඇතිවෙන්නේ සදහට ම ආයේ කිසිම විඳීමකට අහුවෙන්න නෙමෙයි. මේ විඳීම අතහැරලා අර විඳීම අල්ලනවා කියලා එකක් නැහැ. නැත්නම් මානුෂික විඳීම අතහැරලා දිව්‍ය විඳීම අල්ලනවා කියලා එකක් නැහැ. ස්පර්ශ ප්‍රත්‍යයෙන් යම්කිසි විඳීමක් හටගන්නවා ද ඒ සියළුම විඳීම් කෙරෙහි යථාභූත ඤාණය ඇති වෙලා තමයි අතහරින්නේ. ඇල්ම දුරු කරන්නේ. එපා වෙච්ච ගමන් ඇල්ම දුරු වෙනවා. ඇල්ම දුරු වෙච්ච ගමන් එයා පිරිසිදු වෙනවා.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා සංඥාවත් එහෙමයි. ඒකාන්ත සැපයක් විතරක් තිබුණා නම් මේ සත්වයා මේ සංඥාවට කළකිරෙන්නේ නැහැ. එපා වෙන්නේ නෑ. මේ සංඥාවේ දුකක් තියෙනවා. දුකක් තියෙන නිසා මේ සත්වයා මේ සංඥාව කෙරෙහි කළකිරෙනවා. එයා ඒ දුක අවබෝධ කරන්න ඕන. නැත්නම් එපා වෙන්නේ නැහැ. අපි අසනීප වෙච්ච කෙනෙක් ගමු. එයා හිතාගෙන ඉන්නේ එයා කලින් ලෙඩ හැදිච්ච නැති කාලේ ගැන. "අනේ...මට

©Mahamevnawa Monastery, Sri Lanka.
www.mahamevna.org | www.gautamabuddha.org

ඉස්සර කිසි ලෙඩක් තිබුනේ නැහැ. ඉහෙන් බහින ලෙඩක් තිබුනේ නෑ. දැන් මෙහෙම හැදුනානේ..” කියලා ලෙඩ නැතිව තිබ්ච්ච කාලේ සැපයට සිත පිහිටුවාගෙන දැන් තියෙන අසනීපය ගැන දුක් වෙවී ඉන්නවා මිසක් ඒ මේ කය ම යි කියලා හිතන්නේ නැහැ. මං ආශ්වාදයක් හෙව්වේ යම් කයකින් ද, ඒ කය ම නේද දැන් මේ තියෙන්නේ කියලා, ඒ කය ම නේද මේ ආදීනව දෙන්නේ කියලා යථාර්ථවාදීව බලන්නේ නෑ. ඒ විඳීමත් එහෙමයි. සංඥාවත් එහෙමයි.

දැන් ගත්තොත් කලකදි රූපේ ලස්සන කෙනා විරූපී වෙලා යනවා. එතකොට එයා විරූපී පින්තූරේ ඉස්සරහට දාන්නේ නෑ. ලස්සන එක තමයි ෆොටෝ එකක් ගහලා තියාගන්නවා ‘මම මෙහෙම කෙනෙක් දැන් මෙහෙම වුණාට’. එතකොට අනිත් අයත් බලන්නේ ඒ විදියට ම මිසක් දැන් ඉන්න තත්වය ගැන සිහිකරන්ට කැමති වෙන්නේ නෑ. එතකොට බලන්න අපේ සිත හැම තිස්සේ ම ඒ විදියට යනකොට කොයිතරම් සියුම් නුවණක් තියෙන්න ඕන ද මේක විනිවිද දැකගන්න?

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා මේ සංස්කාර ගැන. සංස්කාර ඒකාන්තයෙන් ම සැපයක් නම් මේ සංස්කාරයෙහි දුකක් ඇත්තේ ම නැත්නම් සත්වයෝ මේ සංස්කාර කෙරෙහි කළකිරෙන්නේ නැහැ. සත්වයන් මේ සංස්කර කෙරෙහි කළකිරෙන්නේ මොකද? මේකෙ දුකක් තියෙන නිසා. හරියට ම නුවණින් කල්පනා කර කර විමසුවොත් අන්තිමට මරණාසන්න වෙනකොට හොඳට නුවණින් විමසලා බැලුවොත් මේ ගහපු පදයකුත් නෑ. බෙරේ පලුවකුත් නෑ . අන්තිමට අතීතය ම සම්පූර්ණයෙන් අමතක වෙලා යනවා. සංසාරේ ගතකරද්දී අපි රජවරුවෙලා ඉන්න ඇති, සිටුදේවීන් වහන්සේලා වෙලා ඉන්න ඇති. කෝ දැන්? දාසියෝ වෙලා ඉන්න ඇති. දාසයෝ වෙලා ඉඳලා ඇති. කෝ දැන්? නයි, සර්පයෝ වෙලා ඉඳලා ඇති. දෙවිවරු වෙලා ඉඳලා ඇති. කෝ දැන්? ඒ සියළුම සංස්කාර අනිත්‍ය වෙලා ගියා. මේ සංස්කාරත් අනිත්‍ය වෙලා යයි. ඒක කාටවත් වළක්වන්නට බෑ. මේ අනිත්‍ය කියන ධර්මතාවය මේ ලෝකේ සියළුම දෙනාට පොදු එකක්. ඒ නිසා මේ ඔක්කෝම නුවණින් විමසන්න කියලා තියෙනවා.

©Mahamevnawa Monastery, Sri Lanka.
www.mahamevna.org | www.gautamabuddha.org

බුදුරජාණන් වහන්සේ **ඛජ්ජනීය සූත්‍රයේ** දී මේ විදියට රූපය විසින් කාලාදානවා; වේදනාව විසින් කාලා දානවා; වේදනාව විසින් කාලා දානවා; සංඥාව විසින් කාලා දානවා; සංස්කාර විසින් කාලා දානවා; විඤ්ඤාණය විසින් කාලා දානවා කියලා නුවණින් විමසන්න කිව්වේ ඇයි? මේකේ ඇත්තම ස්වභාවය මොකද්ද කියලා තේරුම් ගන්න පුළුවන් වෙන්නේ. සාමාන්‍යයෙන් අපි ඇත්ත ස්වභාවයට සිත යොමු කරනවාට වඩා තියෙන්නේ මුලා වෙලා ඉන්න එකනේ. ඒ නිසා ඇත්ත ස්වභාවය දැනගන්න නුවණින් විමසන්න ඕන. ඉතින් බුද්ධ දේශනා කියවද්දී හරි පුදුමයි කිසි උපකාරයක් නැතිව මේක අවබෝධ කළා නේ. අවබෝධ කරල එක එක ක්‍රමයට, එක එක ආකාරයට මේ දුක අවබෝධ කරන්න විස්තර කර කර දෙනවානේ.

ඉතින් උන්වහන්සේ පෙන්වා දෙනවා සංස්කාර ගැන හොඳට නුවණින් විමසද්දි විමසද්දි මේක මේ නිකම් ම නිකම් හිස් වැඩක් කියලා. ඉවරයක් නැති හිස් වැඩක් කියලා. අසවල් දවසේ අසවල් තැන ඉවරවෙනවා කියල තැනක් නෑ. ආර්ය අෂ්ඨාංගික මාර්ගය අනුගමනය කරලා මේවා අතහරිනකම් ම ඉවරයක් වෙන්නෙ නෑ මේවා. යථාභූත ඥාණය උදාකරගෙන අතහරිනකම් ම ඉවරයක් වෙන්නෙ නෑ මේවා. මොකද අපි දැන් කල්ප ගාණක් මුළුල්ලේ ආපු ගමනක්නේ මේ.

බුද්ධ දේශනාවේ ම තියෙනවා නේ අපි හෙළු කඳුළු කොච්චරද කියලා. කොච්චරක්ද? සතර මහා සාගරයේ ජලයට වැඩියි කියල. එහෙමනම් අපි කොහොම ගමනක් එන්න ඇත්ද? දැන් මේ මනුෂ්‍ය ජීවිතයේදී අපි බොහෝම චුට්ටනේ කඳුළු හෙලන්නේ. එතකොට බලන්න සිව්මහා ජලය ඉක්මවා යන්න නම් මේ ගමන අපි කොච්චර පරණ ඇත්ද? හිතන්න බෑ. ඒකනේ බුදුරජාණන් වහන්සේ වදාළේ මේ ජීවිතේ හරියට අවබෝධ කරගන්න කියලා. අපිට අනිත් ඒවා මොකුත් වෙන නෑ, අපිට අවබෝධ කරගන්න පුළුවන් අනික් හැම එකක් ම මේ විදියමයි කියලා. මොකද මේ එක වල්ලේ එක පොල් ගෙඩියක් අල්ල ගත්ත නම් ඉතුරු වල්ලෙන් පොල් ගෙඩි මෙහෙමයි කියලා තේරුම් ගන්න පුළුවන්. මොන ජීවිතයට වුනත් අනිත්‍ය වූ රූපයක්, වේදනාවක් අනිත්‍ය වූ දෙයක් තියෙන්නේ කියලා. ඒකනේ පංච උපාදාන ස්කන්ධය වඩන්න කියන්නේ එකොලොස් ආකාරයට.

©Mahamevnawa Monastery, Sri Lanka.
www.mahamevna.org | www.gautamabuddha.org

එතකොට අර හිත පිහිටන තැන්වල සිත නො පිහිටා යනවා. තෘෂ්ණාව හටගන්නේ නැතිව යනවා.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා මේ විඥ්ඥාණය ගැන. මේ විඥ්ඥාණයේ එකාන්ත සැපයක් තිබුණා නම්, දුකක් නො තිබුණා නම්, කවදාවත් සත්වයෝ විඥ්ඥාණය කෙරෙහි කළකිරෙන්නේ නැහැ කියනවා. කළකිරෙනවා කියනවා මේ කෙරෙහි. ඒ මොකද? දුකක් තිබෙන නිසා. බුදුරජාණන් වහන්සේ දුක්ඛ ආර්ය සත්‍යය ගැන දේශනා කරන තැන කියනවා. **(සංඛිත්තේන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා)** සංක්ෂේපයෙන් කීවොත් (හකුළුවා කීවොත්) මේ පංච උපාදානස්කන්ධය ම යි කියනවා දුක. එතකොට ඒ සත්වයා ඇළුනේ ආශ්වාදය තියෙන නිසා. එතකොට මේ සත්වයා පංච උපාදාන ස්කන්ධය කෙරෙහි කළකිරෙන්නේ මේකේ ආදීනවයක් තිබෙන නිසා. නමුත් ඒ ආදීනවය යථාභූත ඥාණයක් හැටියට අවබෝධ කරගත්තේ නැත්තන් එයා මේ කෙරෙහි කළකිරී වෙන එකක් පතනවා. ඒ නිසා සාමාන්‍යයෙන් ධර්මය තේරුම් ගිහිල්ලා පතන්නේ නැතිව මිසක් නැත්නම් අපි පත පත නේද හිටියේ? පත පත හිටියේ ලස්සන කෙනෙක් දැක්කම ඒ වගේ උපදින්න ඇත්නම්, මිහිරි හඬක් ඇහුනොත් 'ආ....මේ හඬ තියෙන එක්කෙනෙක් වෙලා උපදින්න ඇත්නම්' පත පතා හිටියේ ධර්මයට ආපු නැති සියළු දෙනා පතනවානේ. අඩුතරමේ මේ මැරිච්ච මළකුණ දිහා බලාගෙනත් පතනවානේ. "ආයේ අප අතරම ඉපදේවා! දැම්ම නිවන් දකින්න එපා!" එහෙම කියන අය නැද්ද? මම කල්පනා කරනවා මේ විලි ලැජ්ජ නැතිව කියනවානේ මේවා. ලෝකේ ගැන දන්න අය මේ ලෝකේ නෑ කියලා හිතාගෙන ඉන්නේ. නමුත් ලෝකේ දන්න අය ඉන්නවා. ජීවිතේ ගැන ටිකක් හරි තේරෙන අය නැද්ද? ඒ අය මැද්දේ තමයි කියන්නේ "එපා! දැන්ම ම නිවන් දකින්න. ආයේ ආයේමත් අපි අතර ම අපේ ම දරුවෙක් වේවා!" කියලා. එතකොට අපට හොඳට තේරෙනවා අවබෝධයක් නැතිකම ම යි ලෝකේ තියෙන්නේ.

ඉතින් බුදුරජාණන් වහන්සේ අහනවා මතකද ඔබට **සුත්ත නිපාතයේ අජිත සූත්‍රයේ දී (කේනස්සු නිවුතෝ ලොකෝ)** මේ ලෝකය වැහිලා තියෙන්නේ මොකෙන්ද? **(අවිජ්ජාය නිවුතෝ ලෝකෝ)**

©Mahamevnawa Monastery, Sri Lanka.
www.mahamevna.org | www.gautamabuddha.org

ලෝකය වැහිලා තියෙන්නේ ආර්ය සත්‍යය නො දැනීම කියන කළුවරෙන්. ඒකෙන් වැහුනට පස්සේ තියෙන්නේ පංච උපාදාන ස්කන්ධයට අහුවීම විතරයි. ඊටපස්සේ මුකුත් නැහැ.

ඒනිසා අපි නුවණින් විමසීම කියන දේ ඉගෙන ගත්තොත් මේ ජීවිතේ දී ම මේ රූප, වේදනා, සංඥා, සංස්කාර, විඤ්ඤාණයන් ගේ ඇත්ත ස්වභාවය ම නුවණින් විමස විමසා තේරුම් ගන්න දක්ෂ වුණොත් අන්න එදාට තමයි අපිට සතුටු වෙන්න පුළුවන් වෙන්නේ මේ මනුෂ්‍ය ජීවිතයෙන් නියම ප්‍රයෝජනය ගත්තා කියලා. නැත්නම් ඒ වෙනුවෙන් ලැබෙන කිසිම උත්සවයක්, සම්මානයක්, ගෞරවයක් මේ හුළඟේ යන දේවල්. කිසිම එලක් නැහැ. "මම නම් මේ ජීවිතය ගැන සතුටු වෙන්නේ නියම විදියට මේ ධර්මය අවබෝධ කරලා මේ දුකින් නිදහස් වෙච්ච දාට තමයි"

එතකොට ඔබත් එහෙම තමයි වෙන්න ඕන. අපිට නැත්නම් කොච්චර ගෞරව ලැබුණත්, නින්දා ලැබුණත් මේ දෙක ම අනිත්‍ය දේවල් නේද? ඒ නිසා නින්දා, ප්‍රශංසා කියන දෙකට කම්පා වෙවී ඉන්න ගියොත් ජීවිතය නම් අවබෝධ කරන්න ලැබෙන්නේ නෑ. ඒ නිසා අපි ඒවා මේ තණකොළ ගාණටවත් ගණන් නො ගෙන අතහැරලා අපි මේ ජීවිතේ අවබෝධ කරන්න තමයි කල්පනා කරන්න ඕන. ඒ කැපවීම තමයි අපිට යහපත පිණිස හේතු වෙන්නේ. ඒ නිසා ඒක හොඳට තේරුම් අරගෙන හොඳට හිතන්න ඕන.

බුදුරජාණන් වහන්සේ පැහැදිලිව ම දේශනා කළා මේ මහාලි සූත්‍රයේ දී "පින්වත් මහාලි, මේ විදියට දැක්කොත් එයා ජීවිතේ ගැන, එයා මේ රූපය අවබෝධ කරගන්නවා, වේදනාව අවබෝධ කරගන්නවා, සංඥාව අවබෝධ කරගන්නවා, සංස්කාර අවබෝධ කරගන්නවා, විඤ්ඤාණය අවබෝධ කරගන්නවා. අවබෝධය නිසා එයා කළකිරෙනවා. කළකිරෙන නිසා එපා වෙනවා. එපා වුන නිසා අතහරිනවා. අතහැරියා ම එයා පිරිසිදුයි." ඔතනටයි එන්න තියෙන්නේ.

එතකොට අපිට තේරෙනවා මේක පැතුමකින් කළ හැකි දෙයක් නෙමේ. එකඟ වෙන්නේ නැතිව බලන්න පොඩ්ඩක් පතලා. "ආ... ස්වාමීන් වහන්සේ පැතුමකින් මේක කරන්න බෑ කියලා කියනවා නේ මම පෙන්වන්නම් කරලා කියලා පුළුවන්නම් බලන්න පතලා..."

©Mahamevnawa Monastery, Sri Lanka.
www.mahamevna.org | www.gautamabuddha.org

අන්තිමට තේරෙයි "මං මේ මොකද්ද කර ගත්තේ?" කියලා. කවදාවත් මේක එහෙම කරන්න බෑ. මේක අවබෝධ කරලා ම යි තේරුම් ගන්න තියෙන්නේ.

ඒ නිසා මේ පංච උපාදානස්කන්ධය යථාර්ථයෙන් අවබෝධ කරගෙන, මේ දුක්ඛ ආර්ය සත්‍යය හැටියට අවබෝධ කරගෙන, මේ කෙරෙහි ඇති යථාභූත ඤාණය උපදවාගෙන, ඇල්ම දුරු කරලා, මෙයින් නිදහස් වෙලා, සදාකාලික පිවිතුරුභාවය තුළින් ම මේ ගෞතම බුදු සසුනේ ම උතුම් චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ කරගැනීමේ භාග්‍යය උදාවේවා!

සාදු! සාදු!! සාදු!!!

©Mahamevnawa Monastery, Sri Lanka.
www.mahamevna.org | www.gautamabuddha.org